# පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා වල මනෝවිද්‍යාත්මක පැතිකඩ (2010-2014 හෝමාගම කලාපය ඇසුරින්)

නිරෝමි ගුණරත්න[1]

මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීමේ සිට ප්‍රතිඵල නිකුත් කර මැතිවරණයට මුල් වූ කාරණය මුදුන් පමුණු වන තුරු මැතිවරණයට සම්බන්ධ හේතු පදනම් කර ගනිමින් ඇති වන ප්‍රචණ්ඩත්වය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ( Election Violance) වේ. මේවා මූලික කොටස් දෙකකි.

පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා

ක්‍රියාවක් ලෙස බැලූකල කොටස් දෙකෙහිම අසමානකම් නොපැවතුනත් කාලසීමාව අනුව මෙහි විෂමතා පවතී. මාගේ පර්යේෂණයට යොදාගනු ලබන්නේ මින් පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ තත්වයයි. මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීමත්, මැතිවරණය පැවැත්වීමත් අතර කාලසීමාව තුළ දී ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ ආධාරකරුවන් මෙන්ම, එකම පක්ෂයේ සාමාජිකයින් අතර ඇතිවන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වේ. සුළු අපරාධවල සිට මිනීමැරීම දක්වාම සංකීර්ණ වන මේවා මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර මුල්කර ගනිමින් බිහිවන අතර තම පක්ෂයේ පාට, සංකේතය ආදිය සෙසු පිරිසට සන්නිවේදනය කිරීම අරමුණයි. මේ යටතට බැන වැදීම, පහර දීම, තර්ජණය කිරීම, මැතිවරණ කාර්යාල, බැනර්, පෝස්ටර්, සැරසිළි වලට හානි සිදු කිරීම, පෙළපාලි පා ගමන් වලට බාධා කිරීම, ඡන්ද කාඩ් සොරාගැනීම ආදිය අයත් වේ. මෙවැනි පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සංවිධානාත්ම ප්‍රචණ්ඩ ක්‍රියා හා ස්වභාවික ප්‍රචණ්ඩ ක්‍රියා ලෙස නැවත කොටස් වේ. මාගේ පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වූයේ මෙවැනි පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල මනෝවිද්‍යාත්මක පැතිකඩ අධ්‍යයනය කිරීමයි.

ඒ අනුව මෙහි මනෝවිද්‍යාත්මක පැතිකඩ මූලික කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. එනම් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන පිරිස හා ප්‍රචණ්ඩත්වයට යටත් වන පිරිස සම්බන්ධ මනෝවිද්‍යාත්මක අධ්‍යයනය වශයෙනි. පොදුවේ ගත් කළ මෙම දෙපාර්ශවයන් තුළම පැවති මානසික තත්වය ලෙස අවිනිශ්චිතතාවය මත පදනම් වූ සිතිවිලි දාමය හා දැඩි චිත්තවේගික තත්වයන්, පෞරුෂත්වය හා සම්බන්ධ ගැටළු, වැරදි සමාජානුයෝජන කාරක, හීනමානය, අධිතක්සේරුව, විවිධ ප්‍රේරිත චර්යාවන් ආදී ලක්ෂණත් මෙයට අමතරව ප්‍රචණ්ඩත්වයට යටත් වන වින්දිතයන් තුළින් භීතිකාමය ලක්ෂණ, දැඩි කංසාමය රෝග ලක්ෂණ, කළකිරීම, සැකය, අසුභවාදී සිතුවිලි ආදිය මෙන්ම දැඩි ඉච්ඡාභංගත්වයත් පිළිබිඹු විය. සමස්තයක් ලෙස ඉහත ප්‍රතිඵල ඇතිවීමට හේතුවන මැතිවරණ ප්‍රචණ්ඩත්වයට බීමත්කම හා මිනිසුන්ගේ නූගත් ගතිලක්ෂණ මුල්වන බව පර්යේෂණය තුළින් තවදුරටත් ප්‍රත්‍යක්ෂ විය.

ප්‍රමුඛ පද : මැතිවරණය, ප්‍රචණ්ඩක්‍රියා, මනෝවිද්‍යාත්මක, මානසිකත්වය

1 සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය